# ලක්දිව රාජ්‍යත්වයේ ආරම්භය හා විකාශනය

***සුභාෂණී, ආර්. එම්. එන්.*** [1]

අතීත ලාංකේය රාජ්‍යය පාලනයෙහි පැවති ප්‍රධානතම තනතුර වූයේ රජ තනතුරයි. නැතහොත් සියලු පාලන සංස්ථාවල ප්‍රධානියා රජු ලෙස හඳුන්වාදිය හැකිය. රාජ, මිහිපති, භූසුර, භූපති ආදි පර්යාය නාමයන් රජු හැඳින්වීම සඳහා භාවිත කරයි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ලක්දිව රාජ්‍යත්වයේ ආරම්භය හා විකාශය පිළිබඳ අධ්‍යයනය කිරීමය. මෙම පර්යේෂණයේ වැදගත්කම ලෙස රාජ්‍යත්වය ආරම්භය හා විකාශය වීමේදී මූලික වූ නියමයන් අධ්‍යයනය කිරීම දැක්විය හැකිය. මෙම පර්යේෂණයේ ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කරන අතර, ප්‍රාථමික මූලාශය අතර **'මහාවංසය'**, **'දීපවංසය'**, **'වංසත්තප්පකාසනිය'**, සහ ශිලා ලේඛනද, ද්විතීයික මූලාශ්‍රය ලෙස වෙනත් ඓතිහාසික ග්‍රන්ථද භාවිත කරනු ලැබේ. මෙරට රජ පදවිය විජයගෙන් ආරම්භ වූ අතර, එය ස්ථාපිත වීම සඳහා අභිෂේකය අනිවාර්ය විය. අභිෂේකයෙන් අනතුරුව රාජ්‍යයත්වය ස්ථාපිත වූ අතර, රජ පදවිය විකාශනය වූ ආකාරය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි අරමුණ වේ. ලක්දිව රාජ්‍යයත්වයේ ආරම්භය විජයගෙන් සිදු වූ බව, එය ස්ථාපනය වීම සඳහා අභිෂේකය මූලික වූ බව, රජ පදවිය විකාශනය වීමේදී පියාගෙන් පුතාට හා සහෝදරයාගෙන් සහෝදරයාට රජකම හිමි වූ බව, ලක්දිව රජ පදවිය ආරම්භ වීමෙන් පසුව විවිධ නියමයන් මත රාජ්‍යයත්වය ස්ථාපිත වීම හා විකාශය වූ බව මෙම අධ්‍යයනය මගින් නිගමනය කළ හැකි විය.

**ප්‍රමුඛ පද:** රාජ්‍යත්වය, රජු, විකාශනය

*[1]ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, ඉතිහාසය අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*ragamunige@gmail.com*